**ශීර්ෂය 166 - නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**
**-----------------------------------------------------------------------------------------------------------**

ශීර්ෂය 166 - නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුලි 10 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**----------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**
**-------**

**2.1 විසර්ජන ගිණුම**
**----------------**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**
**-------------------------**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 34,731.40 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 26,577.15 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 8,154.25 ක් හෙවත් සියයට 23.48 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 171.16 | 166.95 | 4.21 | 2.46 |
| මූලධන | 34,560.24 | 26,410.20 | 8,150.04 | 23.58 |
| **එකතුව** | **34,731.40** | **26,577.15** | **8,154.25** | **23.48** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 16601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 6.00 | 5.84 | 3.50 | 4.00 | 19.00 | 13.91 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 03 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 5.73 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0146/000 | 0.37 |
| 6000/0000/00/0013/0101/000 | 1.34 |
| 6000/0000/00/0016/0092/000 | 4.02 |
| එකතුව | **5.73** |

## 2.4 විගණන නිරීක්ෂණය

----------------------

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, අත්තිකාරම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 03 ඡේදයේ සඳහන් කර ඇත.

## 3 ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ

--------------------------------------

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (i) | හානි ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ii) | ස්ථාවර වත්කම් ලේඛනය | මුදල් රෙගුලාසි 502 (2) හා 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

## 3.2 අස්ථානගත වූ වවුචර්

----------------------

සමාලෝචිත වර්ෂයට අදාළ රු.20,231 ක ගෙවීම් වවුචරය අස්ථානගත වී තිබුණි. එම නැති වූ වවුචරය පිළිබඳව විසර්ජන ගිණුමේ හෙළිදරව් කර නොතිබුණු අතර, ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.3 විසර්ජන ගිණුම

-----------------

### අයවැය විචලනය

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති 04 කට අදාළ වැය විෂයයන් 08 ක් සඳහා සලසා තිබුණු රු. මිලියන 159.7 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 12 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 26 ක සිට සියයට 90 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ඇ) ජල සැපයුම් අංශයේ ප්‍රජා පහසුකම් ව්‍යාපෘතිය යටතේ වන ව්‍යාපෘති 09 කට අදාළව පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් රු.මිලියන 2,729.9 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ප්‍රතිපාදනවලින් උපයෝජනය කළ පසු රු.මිලියන 1,860.9 ක් හෙවත් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 68 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ඒ අනුව අවශ්‍ය ප්‍රමාණයට වැඩියෙන් පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි.

### 3.4 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

2005 දෙසැම්බර් 10 දින සිට වැඩ තහනමට ලක්ව තිබුණු සේවකයකුගේ රු. 38,095 ක්වූ හිඟ ණය ශේෂය අඛණ්ඩව ඉදිරියට ගෙන එමින් පැවති අතර, එම සේවකයා 2013 ජුනි 07 දින සේවයෙන් පහකර තිබුණි. තවද 2017 අගෝස්තු 11 දිනැති අංක 2/1/2015/09 දරන ලිපිය මගින් අමාත්‍යාංශ ලේකම්වරයා එවා තිබුණු පිළිතුරු ලිපියට අනුව, එම ණය ශේෂය ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා තිබුණත්, 2017 සැප්තැම්බර් 30 දින වන විටත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

#### 3.5.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2016 ජුලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 3.6 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2017 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2017 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍යාංශයට අයත් නොවන රාජ්‍ය ආයතන 11 ක් සතු වාහන 16 ක් විධිමත් පරිදි පවරා නොගෙන අමාත්‍යාංශය විසින් පරිහරණය කර තිබුණි.

(ii) අමාත්‍යාංශයට අයත් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතු වාහන 11 ක් 2015 සහ 2016 වර්ෂවල අමාත්‍යාංශයට මුදාහැර තිබුණි. 2016 අගෝස්තු 04 දින එම වාහනවලින් එක් වාහනයක් ආපසු භාරදී තිබුණු අතර තවත් වාහනයක් 2016 සැප්තැම්බර් 06 දින අළුත්වැඩියාව සඳහා නියෝජිත ආයතනයට යවා තිබුණත්, එය අළුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පවතින බවත් සඳහන් කර තිබුණි. එම වාහන වෙනුවෙන් 2016 වර්ෂයේදී මණ්ඩලය විසින් රු. 1,666,150 ක් වැය කර තිබුණි.

(ඇ) **වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

2016 වර්ෂයේදී ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවයේ නියුතු නිලධාරීන් හා සේවකයන් 43 ක් නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයට මුදාහැර තිබුණි. 1995 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ මුදාහැර තිබූ අතර එම සේවකයන් හා නිලධාරීන් 43 ක් අතරින් 39 දෙනෙකුට අදාළව විගණනයට ඉදිරිපත් කළ විස්තර අනුව 2016 වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු.30,393,767 ක් හා සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකය සඳහා රු. 3,129,687 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ගෙවා තිබුණි.

## 3.7 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 371 | අවස්ථා 6 කදී විවිධ කාර්යයන් සඳහා නිකුත් කර තිබුණු තත් කාර්ය අතුරු අග්‍රිම, අදාළ කාර්ය අවසන් වූ වහාම එම අග්‍රිම නිරවුල් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | අමාත්‍යාංශය සතු සංචිත වාහනවලට අදාළ දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

(ආ) **ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ**
**------------------------------------**

2010 මැයි 14 දිනැති අංක
CA/1/17/ 1 / 2010 දරන ලිපියේ

| | |
|---|---|
| (i) 3 ඡේදය | අමාත්‍යවරයාගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන්කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 03 ක් වී තිබුණත්, අමාත්‍යාංශය විසින්ඒ සඳහා වාහන 05 ක් වෙන්කර තිබුණි. |
| (ii) 3.4 ඡේදය | අමාත්‍යවරයාගේ පුද්ගලික ලේකම්වරයාට හා මාධ්‍ය ලේකම්වරයාට එක් වාහනය බැගින් පරිහරණය කිරීමට හිමිකම තිබුණත්, වාහන 02 ක් බැගින් ඔවුන් වෙත වෙන්කර තිබුණි. |

(ඇ) **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**
**----------------------------**

| | |
|---|---|
| 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2.11 ඡේදය | අමාත්‍යාංශයේ වාහන සම්බන්ධයෙන් ඉන්ධන දහනයවීම පිළිබඳ පරීක්ෂාවන් සිදු කර නොතිබුණි. |

## 3.8 විදේශාධාර ව්‍යාපෘති
**---------------------**

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මුල්‍යනය යටතේ අවිච්ඡේද ව්‍යාපෘති 17 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 25,000 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 22,548.73 ක් උපයෝජනය කර තිබුණි. එම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය**
**-----------------------------------------**

පහත විස්තර දක්වන විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් 2016 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය කාර්යසාධනය හා භෞතික කාර්යසාධනය පහත පරිදි විය.

| **ව්‍යාපෘතිය** | **ව්‍යාපෘතිය නිම කිරීමට සැලසුම් කළ දිනය** | **මූල්‍ය කාර්යසාධනයේ ප්‍රතිශතය** | **භෞතික කාර්යසාධනයේ ප්‍රතිශතය** |
|---|---|---|---|
| ---------- | ----------- | ---------- | --------- |
| යාපනය - කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 2020.05.14 | 17 | 38 |

| | | | |
|---|---|---|---|
| වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 2017.12.31 | 65.5 | 85.8 |
| මහ කොළඹ ජල හා අප ජල කළමනාකරණ ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 01 | 2016.12.31 | 36.25 | 24.07 |
| මහ කොළඹ ජල හා අප ජල කළමනාකරණ ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 02- ආසියානු සංවර්ධන බැංකුව | 2019.06.30 | 8.41 | 3.66 |
| මහ කොළඹ ජල හා අප ජල කළමනාකරණ ප්‍රවර්ධන ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 02- AFD (අඹතලේ බලශක්ති සංරක්ෂණ ව්‍යාපෘතිය) | 2019.12.31 | 4.36 | 3.32 |

**3.9 අනාර්ථික ගනුදෙනු**

**----------------------**

අමාත්‍යාංශයේ විදුලි බිල්පත් නියමිත දිනට පෙර නොගෙවීම නිසා රු. 21,493 ක ප්‍රමාද ගාස්තු ගෙවා තිබුණි.

## 3.10 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳව තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 22 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 05 | 02 | 03 |
| (iii) | ද්විතියික මට්ටම | 81 | 56 | 25 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 40 | 34 | 06 |
| | **එකතුව** | **153** | **114** | **39** |